සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015
# භූගෝල විද්‍යාව I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01 පෘථිවියේ ජල ගෝලයේ පවතින මිරිදිය ජලයෙන් 11.02% ක් ........................................................ වේ. (මතුපිට ජලය, භූගත ජලය, පාංශු ජලය)

02 කොංගෝ ගංගාව අයත් වන්නේ .................................................. මහාද්වීපයට ය. (ආසියා, අප්‍රිකා, දකුණු ඇමෙරිකා)

03 පෘථිවි ස්ථර වල සංයුතිය අනුව 70km ක් දක්වා ගැඹුරින් ................................................ පිහිටා ඇත. (කබොල, ඉහළ ප්‍රාවරණය, පහළ ප්‍රාවරණය)

04 පෘථිවි භූකාරක තැටි ව්‍යාප්තිය අනුව ..................................... තැටිය දකුණු ඇමෙරිකානු තැටියට බටහිරින් පිහිටා ඇත. (පැසිපික්, ඇන්ටාටික්, නැස්කා)

05 එඩ්නා ගිනිකන්ද අයත් වන්නේ .................................................................. රටට වේ. (පිලිපීන, සිසිලි, ඉතාලි)

06 ටයිගා වනාන්තර .......................................... කර්මාන්තය සඳහා බහුලව උපයෝගී කර ගනී. (කඩදාසි, දැව, ඛණිජ)

07 සෞම්‍ය කලාපීය තෘණබිම් අතර ඕස්ට්‍රේලියාවේ ....................................... තෘණබිම දක්ෂිණාර්ධ ගෝලයේ පිහිටයි. (වෙල්ඩ්, ප්‍රෙයරීස්, ඩවුන්ස්)

08 මධ්‍යධරණී දේශගුණය ආශ්‍රිත වර්ෂාපතනය මිලි මීටර් ..................................... පමණ වේ. (800, 900, 1000)

09 ධීවර කර්මාන්තය ශ්‍රී ලංකාවේ ................................................. යන අංශයට ඇතුලත් ය. (කර්මාන්ත, කෘෂිකර්ම, සේවා)

10 ජපානයේ නැව් කර්මාන්තය සඳහා ........................................ බලපා ඇති ප්‍රධාන සාධකයකි. (ඉන්ධන පහසුව, ලාභදායි ශ්‍රමය, යපස් ලබා ගැනීම.)

- **අංක 11 සිට 20 දක්වා වූ ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (x) ලකුණද යොදන්න.**

11 දකුණු කොරියාව වර්තමානයේ නැව් තැනීම සඳහා පාරම්පරික නැව් තැනීමේ රටවල් සමඟ තරගකරයි. ( )

12 යුධ උපකරණ නිෂ්පාදනය අයිති වන්නේ විද්‍යුත් කර්මාන්තයට වේ. ( )

13 ෆයිබර් ග්ලාස් යොදාගැනීම වර්තමානයේ නැව් තැනීමේ කර්මාන්තයේ ප්‍රවණතාවයකි. ( )

14 බුත්තල හා මස්කෙලිය ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්මික ජනපද පිහිටි ස්ථාන 2 කි. ( )

15 ජපානය ආනයනික සම්පත් මත පිහිටා කර්මාන්ත සිදුකරන කෘෂිකාර්මික රටකි. ( )

16 බෙඩුවින්වරු උතුරු අප්‍රිකාවේ ආදී වාසී ජනයා වේ. ( )

17 සජීවි ද්‍රව්‍ය පාෂාණ වල බහුලව පැවතිය හැකිය. ( )

18 අවසාදිත පාෂාණ නිර්මාණ සඳහා ජලය හා සුළඟ මගින් සිදුවන පරිවහනය බලපායි. ( )

19 හැමර්ස්ලි වැටිය ඕස්ට්‍රේලියාවේ යපස්වලින් පොහොසත් ප්‍රදේශයකි. ( )

20 ටින් ලෝහය හා මිශ්‍රකොට ලෝහ සෑදීමට තඹ යොදාගනී. ( )

- **අංක 21 සිට 30 දක්වා වූ ප්‍රකාශනවලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

21 පාංශු පැතිකඩක ........................................ මහලෙහි පාංශු වර්ධනයට සම්බන්ධ නොවූ මව් පාෂාණ දැකිය හැකිය.

22 ලෝකයේ භූමියෙන් ...................................................................... ක ප්‍රතිශතයක් වනාන්තර වලින් වැසී ඇත.

23 පයින්, ලාච්, ස්ප්‍රෘස් වැනි ශාක ........................................................................ වනාන්තර වල දැකිය හැකිය.

24 පෘථිවි තලයේ 2.8% ක් පමණ පවතින ජලය ......................................................................................... වේ.

25 උස්බිම් ශ්‍රේණියේ පවතින පාෂාණවල බහුලවම ................................................ පාෂාණ දැකිය හැකිය.

26 බස්නාහිර පළාතේ බෝතලේ හා මීගොඩ පවතින ඛණිජ සම්පත් අතර .................................... වැදගත් වේ.

27 ශ්‍රී ලංකාවේ බෝතල් හා වීදුරු නිෂ්පාදනය සඳහා යොදාගන්නේ ......................................... සහිත ඛණිජ වැලි වේ.

28 වියළි කලාපයේ රතු දුඹුරු පස් සහිත ප්‍රදේශ ........................................................ වගාවට යොදවා ඇත.

29 අවුරුද්ද මුළුල්ලේම ශාක වර්ධනය වීම .......................................... වනාන්තරවල පවතින ලක්ෂණයකි.

30 නයාරු හා කෝකිලායි කළපු ප්‍රදේශවල ............................................................................. ශාක බහුලය.

- **අංක 31 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

31 ශ්‍රී ලංකාවේ පරිසර සංවේදී කලාප ඇති කිරීම තුළින් සිදුවන වඩාත් වැදගත් ප්‍රතිඵලය මින් කවරක්ද?

(1) පස සෝදායාම වැළකීම. (2) වනාන්තර සංරක්ෂණය වීම.
(3) ජනාවාස සුරක්ෂිත වීම. (4) සත්ව සම්පතට වාසස්ථාන අහිමි වීම.

32 ශ්‍රී ලංකාවේ ජල ප්‍රදේශවල කැපීපෙනෙන ජල ව්‍යාප්තියක් වනාතවිල්ලු හා මුරුක්කන් ද්‍රෝණියේ දක්නට ඇත. ඊට අදාළ වන ප්‍රකාශය මෙයින් තෝරන්න.

(1) විශාලම භූගත ජලාශ ඇති ස්ථාන වේ. (2) විශාලම භූතල ජලාශ ඇති ස්ථාන වේ.
(3) කරදිය බහුල ප්‍රදේශ වේ. (4) මිරිදිය ජලාශ වේ.

33 උඩවලවේ ජලාශය හා සේනානායක සමුද්‍රය පිහිටි ගංගා පිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

(1) වළවේ ගඟ හා මහවැලි ගඟ (2) ගල් ඔය හා මහවැලි ගඟ
(3) ගල් ඔය හා දැදුරු ඔය (4) වළවේ ගඟ හා ගල් ඔය

34 ලෝකයේ රටවල් කලාප අනුව ජන සංඛ්‍යාවේ විශාලත්වය අතින් පළමු තැන ගන්නේ ආසියාව වන අතර දෙවැනි තැන ගන්නේ කුමන කලාපයද?

(1) ඇමෙරිකාව (2) අප්‍රිකාව (3) ඕස්ට්‍රේලියාව (4) යුරෝපය

35 ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තිය අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?

(1) මුළු ජන සංඛ්‍යාවෙන් 60% ප්‍රධාන රටවල් 2 ක ඇත.
(2) මුළු ජන සංඛ්‍යාවෙන් 90% ක් දක්ෂිණාර්ධගෝලයේ ඇත.
(3) ලෝක ජන සංඛ්‍යාවෙන් හරි අඩක් ආසියාවේ ඇත.
(4) ලෝක ජන සංඛ්‍යාවෙන් හරි අඩක් 25% ක භූමි ප්‍රදේශයක ජීවත්වේ.

36 තද වර්ෂාව නිසා ෆාම්කොළ වලින් තැනූ නිවාසවල ජීවත්වන ආදී වාසි ජන කණ්ඩායම වන්නේ,

(1) නිග්‍රෝවරු (2) පිග්මිවරු
(3) බෙඩුවින්වරු (4) ඇස්කිමෝවරු

37 ආනයනික සම්පත් සඳහා විශාල විදේශ විනිමයක් වැයකරන කාර්මික රට වන්නේ,

(1) ඉන්දියාව (2) ආර්ජන්ටිනාව (3) ජර්මනිය (4) ජපානය

38 1:50000 පරිමාණයට අඳින ලද මෙට්‍රික් සිතියමක 2cm x 2 cm කොටුවකින් පෙන්වනු ලබන කිලෝමීටර් ගණන වන්නේ,

(1) වර්ග කිලෝමීටර් 4 කි. (2) වර්ග කිලෝමීටර් 6 කි.
(3) වර්ග කිලෝමීටර් 1 කි. (4) වර්ග කිලෝමීටර් 8 කි.

39 
රූපයේ දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ 1:50000 සිතියම් සඳහා යොදාගන්නා සංකේත කිහිපයකි. ඒවා නිවැරදිව පිළිවෙලින් අඩංගු පිළිතුර කුමක්ද?

(1) පන්සල, සංචාරක බංගලාව, අඩිපාර
(2) පන්සල, සංචාරක බංගලාව, කරත්ත පාර
(3) බෞද්ධ සිද්ධස්ථානය, උසාවිය, කරත්ත පාර
(4) බෞද්ධ සිද්ධස්ථානය, සංචාරක බංගලාව, කරත්ත පාර

40 පරිමාණය අනුපාතයක් ලෙස 1:50000 වශයෙන් මෙට්‍රික් සිතියම් වල දක්වනු ලැබේ. මෙයින් අදහස් වන්නේ කුමක්ද?

(1) සිතියමේ සෙ.මී. 1 ක් භූමියේ කි.මී. 50000 පෙන්වන බවයි.
(2) සිතියමේ සෙ.මී. 2 ක් භූමියේ කි.මී. 50000 පෙන්වන බවයි.
(3) සිතියමේ සෙ.මී. 1 ක් භූමියේ සෙ.මී. 50000 පෙන්වන බවයි.
(4) සිතියමේ සෙ.මී. 1 ක් භූමියේ කි.මී. 1 පෙන්වන බවයි.

The National e-learning Portal for The General Education

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. II කොටසින් ප්‍රශ්න 2 කටත්, III කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු දිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න 5 කි.

## I කොටස


01 ඔබ ඉගෙනගත් 1:50000 සිතියම් ආශ්‍රිත දැනුම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ශ්‍රී ලංකා 1:50000 සිතියම්වල වී වගාවේ වර්ණය වන්නේ මින් කුමක්ද? (කහ, කොළ, රතු) (ල. 01)


(2) එම සිතියම්වල ශීර්ෂය දැක්වෙන්නේ මින් කුමන ස්ථානයකද? (ඉහළ වම්පස, ඉහළ දකුණු පස, ඉහළ හරි මැද) (ල. 01)

(3) අක්ෂර යෙදීමේදී ගංගාවක් ඇති තැන අනුගමනය කරන්නේ මින් කවර ක්‍රමයද? (ඊතලයක් යෙදීම, ගඟ දිගේ ලිවීම, අංක යොදා පිටතින් ලිවීම.) (ල. 01)

(4) සෑම සිතියමකම දිශාව දැක්විය හැකි ක්‍රමය මින් කුමක්ද? (ල. 01)




(5) 1:50000 සිතියම් සඳහා යොදාගන්නා රේඛීය පරිමාණ පිළිබඳ සටහන් පහත දැක්වේ. නිවැරදිව රේඛීය පරිමාණය දක්වා ඇති පිළිතුර තෝරන්න. (ල. 01)




(6) කහ වර්ණය හා කොළ පැහැති වර්ණය පමණක් 1:50000 සිතියම්වල භාවිතා කරන්නේ කුමන වගාවන් සඳහා ද? (ල. 01)

(7) සිතියමක x සිට y දක්වා දුර 12 cm කි. මේ අනුව සිතියමට අදාළ සැබෑ ප්‍රදේශයේ දුර km කීයද? (ල. 02)

(8) 1:50000 සිතියම්වල භාවිතා වන මාර්ග වර්ග දෙකක් පහත දැක්වේ. ඒවා නියමිත වර්ණ අනුව ඇඳ පෙන්වන්න.

(අ) A ශ්‍රේණිය ප්‍රධාන මාර්ගය
සෙසු මාර්ග (ල. 02)

(ආ) සපයා ඇති ආකෘති ලෝක සිතියමේ පහත සඳහන් දෑ නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතා කරමින් නම් කරන්න.


(i) ටෝකියෝ (ii) ඇන්ඩීස් කඳු (iii) මලක්කා සමුද්‍ර සන්ධිය
(iv) සමකය (v) සින්ධු ගංගාව (ල. 5)

(ඉ) සපයා ඇති ආකෘති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් දෑ නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතා කරමින් ඇඳ නම් කරන්න.

(i) පුත්තලම (ii) වාලච්චේනායි (iii) අම්බලන්ගොඩ

(iv) සේනානායක සමුද්‍රය (iv) කන්කසන්තුරේ (ල. 5)

## II කොටස





02 පෘථිවියේ ඝනත්වය හා ස්ථරවල සංයුතිය අනුව හරස්කඩක සටහනක් මෙහි දැක්වේ.

(1) රූප සටහනෙහි A, B හා C කොටස් තුන නම් කරන්න.(ල. 03)

(2) B කොටසෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 2 ක් සටහන් කරන්න. (ල. 03)

(3) A වලින් දැක්වෙන ස්ථරයෙහි පවතින ස්ථර දෙක දක්වා ඒවාහි ස්වභාවය පිළිබඳ කරුණු 2 ක් ලියන්න. (ල. 04)

- **අංක 3 හා 4 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේදී පහත ලෝක සිතියම උපයෝගී කර ගන්න.**




03 භූමිය, දේශගුණය, පස හා මානව ක්‍රියාවලීන් අනුව වෘක්ෂලතා කලාප තීරණය වේ. මේවා මිනිස් ක්‍රියාකාරකම් නිසා දැඩි තර්ජනයට ලක් වී ඇත.

(1) A හා B ප්‍රදේශවල පවතින වනාන්තර නම් කරන්න. (ල. 02)

(2) C ප්‍රදේශයේ පවතින වෘක්ෂලතා වර්ගය නම්කර එය මිනිසාට ප්‍රයෝජනවත් වන ආකාරය දක්වන්න. (ල. 03)

(3) මිනිස් ක්‍රියාකාරකම් නිසා වනාන්තර විනාශ වී තිබෙන ආකාරය දැක්වීමට කරුණු 02 ක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

04 ලොව අධිකතම ඉල්ලුමක් ඇති ආහාර නිෂ්පාදන බොහොමයක් බිහිවන්නේ විස්තෘත වාණිජ කෘෂිකර්මය මගිනි.

(1) ඉහත ලෝක සිතියමේ D හා E වලින් දැක්වෙන විස්තෘත වාණිජ කෘෂිකර්මය කෙරෙන ප්‍රදේශ දෙක නම් කරන්න. (ල. 02)

(2) එම කෘෂි රටාව කෙරෙහි බලපාන සාධක 02 ක් දක්වන්න. (ල. 02)

(3) (a) විස්තෘත වාණිජ කෘෂිකර්මයට අමතරව ලෝකයේ සිදුකරන කෘෂිකාර්මික වර්ග 02 ක් දක්වන්න. (ල. 02)

(b) ඔබ දැක්වූ එක් කෘෂිකාර්මික වර්ගයක් ආශ්‍රිත ලක්ෂණ 02 ක් පැහැදිලි කරන්න.

(ල. 04)


05 ජනසංඛ්‍යාව වැඩිවීම හා ඔවුන්ගේ අවශ්‍යතා වැඩිවීම මත වර්තමානයේ ඛණිජ සම්පත් භාවිතය අධික වී තිබේ.

(1) ඛණිජ සම්පතක වටිනාකම තීරණය වීමට බලපාන කරුණු 02 ක් දක්වන්න. (ල. 02)

(2) ඛණිජ සම්පත් ඉක්මනින් ක්ෂය වීමට හේතු 02 ක් දක්වන්න. (ල. 02)

(3) ලෝකයේ ඛණිජ සම්පත් සංරක්ෂණය සඳහා ගෙන ඇති පියවර 03 ක් විස්තර කරන්න. (ල. 06)

## III කොටස





06 රටක මුළු භූමි ප්‍රමාණයෙන් 35% ක් වනාන්තර තිබීම අවශ්‍ය වුවද අද ඉතිරිවන්නේ 22% ක් පමණි.

(1) සිතියමේ දැක්වෙන A, B හා C ප්‍රදේශවල පවතින වනාන්තර වර්ග දක්වන්න. (ල. 03)

(2) A ප්‍රදේශයේ පවතින වනාන්තර ආශ්‍රිත දැව සඳහා වැඩි ඉල්ලුමක් පැවතීමට හේතු 02 ක් ලියන්න. (ල. 02)

(3) B ප්‍රදේශයේ පවතින වනාන්තර වල සුවිශේෂීබව කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)




07 (1) සිතියමේ පෙන්වා ඇති පරිදි A වලින් දැක්වෙන මිනිරන් පතලද, B වලින් දැක්වෙන ඇපටයිට් නිධියද, C වලින් දැක්වෙන යපස් නිධියද නම් කරන්න. (ල. 03)

(2) මිනිරන් වලින් ලැබෙන ප්‍රයෝජන 02 ක් දක්වන්න. (ල. 02)

(3) ශ්‍රී ලංකාවේ දැනට දක්නට ලැබෙන ඛණිජ සම්පත් කැණීම් නිසා සිදුවන පාරිසරික හානි 02 ක් පැහැදිලි කරන්න. (ල. 05)

08 රටක ජාතික ආදායම කෙරෙහි අපනයනට යොමු වූ කර්මාන්ත පැවතීම වැදගත් වේ.

(1) ශ්‍රී ලංකාවේ අපනයනයට යොමු වූ කර්මාන්ත තුනක් දක්වන්න. (ල. 03)

(2) ශ්‍රී ලංකාවේ කර්මාන්ත දියුණු කිරීමේ අවශ්‍යතාව වර්තමානයේ වඩාත් ඉස්මතු වී ඇත. ඊට හේතු 03 ක් දක්වන්න. (ල. 03)

(3) ශ්‍රී ලංකාවේ කර්මාන්ත ආශ්‍රිත ගැටළු 02 ක් දක්වා ඊට පිළියම් 02 ක් දක්වන්න.(ල. 04)

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව

(08) (ආ) ප්‍රශ්නයට අදාළ ලෝක ආකෘති සිතියම




10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව

(01) (8) (ඉ) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම




The National e-Learning Portal for The General Education